**උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2015**

උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2009 නොවැම්බර් 08 දින එළඹි අංක 4728-එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 2 උපලේඛනයේ II ආ වගන්තිය සහ 2014 මැයි 08 දින එළඹි අංක ටීඑෆ් 013787 දරන ප්‍රදාන ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම හා ප්‍රදාන ගිවිසුම අනුව, එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ වගකිවයුතු හා පහසුවෙන් ප්‍රතිචාර දැක්විය හැකි ආකාරයට උතුර, නැගෙනහිර, උතුරුමැද, වයඹ හා ඌව පළාත්වල පළාත් පාලන ආයතන විසින් සපයනු ලබන ප්‍රාදේශිය යටිතල පහසුකම් සේවා වැඩිදියුණු කිරීමයි. ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,497.50 කට සමාන එජඩො මිලියන 106.30 ක් වන අතර, එයින් රු.මිලියන 6,000 කට සමාන එජඩො මිලියන 50 ක් ණය වශයෙන් හා රු.මිලියන 2,537 කට සමාන එජඩො මිලියන 20.30 ක් ප්‍රදාන වශයෙන් මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 මැයි 01 දින ආරම්භ කරන ලද අතර, 2015 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිත විය. පසුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2016 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම

උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍යයැයි සලකනු ලැබූ එවැනි පරික්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය හා ප්‍රදාන වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුම් ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය හා ප්‍රදාන යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ හා ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඊ) ණය හා ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඒ) මූල්‍ය ගිවිසුමේ හා ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ( ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) මූල්‍ය ගිවිසුමේ හා ප්‍රදාන ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) මූල්‍ය ගිවිසුමේ හා ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

උතුරු හා නැගෙනහිර පළාත් වල පළාත් පාලන ආයතන 80කට නිකුත් කරන ලද එකතුව රු.මිලියන 359.10 ක ප්‍රදාන මුදල් අතුරින්, 2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 29.20 ක් වියදම් නොකර අදාළ පළාත් පාලන ආයතන භාරයේ තිබූ අතර, ව්‍යාපෘතිය විසින් දරන ලද වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

#### 2.2.2 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ගිවිසුමේ උපලේඛන 2 හි 1.3.4 ඡේදය අනුව පිළියෙළ කළ යුතු සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය, ව්‍යාපෘතිය විසින් පිළියෙළ කර නොතිබුණි.

(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 364 (3) හි නියම කර ඇති පරිදි සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 32.65 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද සිවිල් වැඩ හා භාණ්ඩ වලට අදාළ එකතු කළ අගය මත බදු ඇතුළත් විස්තරාත්මක ප්‍රකාශන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. පසුගිය වර්ෂය සඳහා වූ මාගේ වාර්තාවේ ඉහත කරුණ පෙන්වාදී තිබුණද, අවශ්‍යතාවයන්ට අනුකූලවන පරිදි ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | ණය/ප්‍රදාන ගිවිසුම්වල මූල්‍යනය කිරීමට එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන. | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ජසංසං | | | | | | | |
| - ණය | 50.00 | 6,000 | 1,000 | - | - | 49.91 | 6,185.00 |
| - ප්‍රදාන | 20.30 | 2,537 | 1,200 | 3.11 | 407.58 | 11.19 | 1,575.27 |
| ශ්‍රීලංර | 34.00 | 3,740 | 42 | 0.17 | 22.12 | 14.23 | 1,568.69 |
| ප්‍රජා දායකත්වය | 2.00 | 220 | - | 0.14 | 18.84 | 4.78 | 529.19 |
| එකතුව | 106.30 | 12,497 | 2,242 | 3.42 | 448.54 | 80.11 | 9,858.15 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ වෙන් කරන ලද අරමුදල් භාවිතයෙන් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම සහතික කර ගැනීමට සමස්ත ව්‍යාපෘති කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි මාසික, කාර්තුමය හා අර්ධ වාර්ෂිකව වගකීම් නියම කරමින් මූල්‍ය හා භෞතික ඉලක්ක සමඟ අරමුදල් වෙන් කිරීම් හා ව්‍යාපෘති සංරචක ආවරණය වන පරිදි විස්තරාත්මක ක්‍රියාකාරි සැලස්මක් පිළියෙළ කළ යුතුය. කෙසේ වුවද, එවැනි සැලස්මක් පිළියෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා වෙන්කරන ලද එජඩො මිලියන 20.30 ක් වූ ප්‍රදාන අතුරින්, 2015 දෙසැම්බර් 31 දිනට එජඩො මිලියන 11.19 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඉතිරි වසර 01 ක් වූ කාලපරිච්ඡේදය තුළ එජඩො මිලියන 9.11 ක් වූ ඉතිරි මුදල් ප්‍රමාණය උපයෝජනය කිරීමේ හැකියාව සැකසහිත වේ.

**3.2 භෞතික ප්‍රගතිය**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලබාගත හැකිවූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතියේ 01 සංරචකය යටතේ උතුර, නැගෙනහිර, උතුරු මැද, වයඹ හා ඌව පළාත්වල පළාත් පාලන ආයතන 101 ක බල ප්‍රදේශයන්හි රු. මිලියන 10,170 කට සමාන එජඩො මිලියන 90 ක මුළු ඇස්තමේන්තුගත පිරිවැයකට යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාකාරකම්, ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට ඒ පිළිබඳ කටයුතුවල භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| ක්‍රියාකාරකම් | 2015 දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|
| | නිම කිරීමට අපේක්ෂා කළ කාර්යයන් | නිම කල කාර්යයන් | ඉටුකර ගැනීම් ප්‍රතිශතය |
| පිවිසුම් මාර්ග සංවර්ධනය | | | |
| - තාර දැමීම | කිලෝමීටර් 865 | කිලෝමීටර් 379 | 43 |
| - කොන්ක්‍රීට් කිරීම | කිලෝමීටර් 135 | කිලෝමීටර් 259 | 191 |
| උද්‍යාන/වෙළඳපොළ ඉදිකිරීම හා කුඩා නගර සංවර්ධනය | ඒකක 405 | ඒකක 171 | 42 |
| මලාපවහන/කාණු පද්ධති පුනරුත්ථාපනය | කිලෝමීටර් 245 | කිලෝමීටර් 41 | 16 |
| අප ජලය බැහැර කිරීමේ පද්ධති පුනරුත්ථාපනය | ඒකක 66 | ඒකක 01 | 1.5 |
| ග්‍රාමීය ජල සැපයුම් පද්ධති | ඒකක 439 | ඒකක 22 | 0.5 |
| ග්‍රාමීය විදුලිබල පද්ධති | කිලෝමීටර් 187 | කිලෝමීටර් 23 | 12 |

ඉහත තොරතුරු අනුව 2015 දෙසැම්බර් 31 දිනට සැලකිය යුතු ලෙස ඉලක්කයන් ඉක්මවා ගිය මාර්ග කොන්ක්‍රීට් කිරීමේ වැඩ හැරුණු විට සියලු යටිතල පහසුකම් සංවර්ධන වැඩකටයුතුවල මන්දගාමී ප්‍රගතියක් වාර්තා විය. කෙසේ වුවද ව්‍යාපෘතියේ ඉතිරි කාලපර්ච්ඡේදය තුළ අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු වලට අදාළ ඉලක්කයන් ළඟාකර ගැනීමේ අවිනිශ්චිත බව විගණනයේදී බැහැර කළ හැකි නොවේ.

(ආ) 2013 මැයි 09 වන විට නිම කිරීමට අපේක්ෂා කරන ලද රු.මිලියන 14.15 ක ඇස්තමේන්තුගත පිරිවැයකට පිරිනමන ලද පුන්ඩුකුටිච් හී මුතුතාවෙලි වෙළඳපොළ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2015 දෙසැම්බර් 31 වන විටද නිමකර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩ ආරම්භ කිරීමට පෙර තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත අදාළ බලධාරීන් විසින් විචලන නියෝග අනුමත කළ යුතු වුවත්, විචලන නියෝග 38 ක් යටතේ එකතුව රු.මිලියන 89.40 ක වැඩ වල විෂය පථය වෙනස් වීම් ව්‍යාපෘති අධ්‍යක්ෂ හෝ අදාළ පළාත් පාලන ආයතන විසින් පසුව අනුමත කර තිබුණි. ඒ අනුව ඉදිකිරීම් වැඩ වල විෂය පථය වෙනස් වීමේ සැළකිය යුතු විචලන අවස්ථා පහත විස්තර කෙරේ.

| වැඩ විස්තරය | ප්‍රමාණ පත්‍ර අනුව වැඩ වල ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන | අනුමත කල විචලන කාර්යයන් රු.මිලියන |
|---|---|---|
| නින්දවූර් ළමා උද්‍යානය | 4.89 | 30.74 |
| මූලායි පාසල් මාවත | 1.38 | 8.48 |

(ආ) මුසලි ප්‍රාදේශීය සභාවේ විලාවතුර මාර්ගයේ හා නානඩ්ඩන් ප්‍රාදේශීය සභාවේ අච්චම්කුලම් මාර්ගයේ 2016 මැයි 23 දින විගණකවරුන් විසින් සිදුකරන ලද භෞතික වැඩබිම් පරික්ෂාවේදී මාර්ග තලයේ ඉරිතැලීම් හා කඩතොලු වැනි අඩුපාඩු නිරීක්ෂණය වීම පුනරුත්ථාපන කාර්යයන් සිදු කරන ලද කාලපරිච්ඡේදය තුළදී තද කිරීම් හා මාර්ගය මට්ටම් කිරීමේ කාර්යයන් සඳහා යොදාගත් තත්ත්ව ආරක්ෂක ක්‍රමවේදයේ අසමත් බව දැක්වෙන්නක් විය.

(ඇ) කාර්යයන් 132 ක් යටතේ සිදුකරන ලද සංවර්ධන වැඩ කටයුතු දින 100 කට වඩා ප්‍රමාදයකින් යුතුව නිම කර තිබූ බව නිරීක්ෂණය විය. ඒ අතුරින් සංවර්ධන වැඩ 16 ක් වසර 01 කට වඩා ප්‍රමාදයකින් නිමකර තිබුණි. තවද, තම්පලගම ප්‍රාදේශිය සභාවේ ලින්ග මාර්ගය නැවත ඉදිකිරීම හා වෙලනායි ප්රාදේශිය සභාවේ මුත්තවේලි වෙළඳපොළ ඉදිකිරීම වසර 3 කට වඩා ප්‍රමාදයකින් නිම කර තිබුණි. කොන්ත්‍රාත්කරුට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම වෙනුවට 1 සිට 6 දක්වා වූ පරාසයක අවස්ථාවන් වලදී අදාල පළාත් පාලන ආයතනවල නිලධාරීන් හෝ ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් කාලය දීර්ඝ කිරීම් අනුමත කර තිබුණි.

## 3.4 නිෂ්කාර්ය / ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උතුරු පළාතේ මුසලි, නානාඩ්ඩන්, මන්නාරම, නැගෙනහිර මාන්තෙයි හා බටහිර මාන්තෙයි ප්‍රාදේශිය සභාවල දුෂ්කර හා අඩු ජනගහනයක් සහිත ප්‍රදේශවල රු.මිලියන 459.91 ක පිරිවැයකට ඉදිකරන ලද ළමා උද්‍යාන, වෙළඳපොල, බස්නැවතුම්, වෙළඳ සංකීර්ණ, පුහුණු මධ්‍යස්ථාන හා සංස්කෘතික ශාලා වැනි සංවර්ධන වැඩ 32 ක් වසර 2 කට වඩා කාලයක් අක්‍රියව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) තලෙයිමන්නාරම දුම්රියපොළ, ඉරනායිඉලුප්පායිකුලම්, පෙරියමඩු හා ආන්දන්කුලම් හී වෙළඳපොළවල ඉදිකළ වෙළඳ සංකීර්ණ හා නල්ලූර් ප්‍රාදේශිය සභාවේ ළමයින් සඳහාවූ ගෘහස්ථ ක්‍රිඩාගාරය සඳහා ඉදිකළ ගොඩනැගිල්ල, පුහුණු මධ්‍යස්ථානය හා සංස්කෘතික ශාලාව නියමිත කාර්යය සඳහා භාවිතා නොකර 2014 සිට වෙනත් කාර්යයන් සඳහා යොදාගෙන තිබුණි.

## 3.5 නොවිසඳී ඇති පෙර විගණන වාර්තාවල පෙන්වා ඇති කරුණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මාගේ වාර්තාවේ පෙන්වා දී ඇති කරුණු අනුව, එකතු කළ අගය මත බදු ගෙවීම් සඳහා වූ ලියාපදිංචියේ වලංගු බව තහවුරු කර ගැනීමකින් තොරව අවස්ථා 19 කදී නගර සභාවක හා ප්‍රාදේශිය සභා 09 ක සිදුකරන ලද සිවිල් වැඩ වල නිරතවූ කොන්ත්‍රාත්කරුවන්ට එකතුව රු.මිලියන 16.2 ක එකතු කළ අගය මත බදු,

ණය මුදලින් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන්, අදාළ පාර්ශවයන්ගෙන් ගෙවීම් ආපසු අයකර ගැනීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) උතුරු පළාතේ පළාත් පාලන ආයතන 34 ක් අතුරින් පළාත් පාලන ආයතන 3 කට කරන ලද ගෙවීම් සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි පරික්ෂා කිරීම්වලදී ලංසු ලියවිලිවල රේටයන් වෙනස් කිරීමෙන් රු.මිලියන 4.42 ක වංචා සහගත ගෙවීම් කර තිබූ බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාව විසින් සිදුකරන ලද පුනරුත්ථාපන කාර්යයන් සඳහා ලංසුකරුවන් තෝරා ගැනීමේ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිවරයා ලෙස ක්‍රියා කරමින් ව්‍යාපෘති ඉංජිනේරු ඔහුගේම සමාගම වෙත එම කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.